# කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ගැටලු සහ අභියෝග බලංගොඩ ප්‍රදේශය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඒ. ඒ. පී දිසානායක*** [1]
***ජී. එම්. හේනේගෙදර*** [2]

සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය මෙරට විදේශ විනිමය උපයන අපනයන බෝග අතරින් ප්‍රමුඛස්ථානය ගන්නකි. විශේෂයෙන් ම උඩරට, මැදරට සහ පහතරට කලාප කේන්ද්‍රකරගෙන දිස්ත්‍රික්ක 14 ක තේ වගාව සිදුකරනු ලැබේ. මුළු තේ වගාවෙන් කුඩා තේ වතු අංශය 73.2% ක දායකත්වයක් සපයන අතර වාර්ෂිකව තේ කිː ග්‍රෑම්ː මිලියන 200 ක් පමණ නිෂ්පාදනය කරනු ලැබේ. වර්තමානය වන විට අමු තේ දළු මිල පහළ යාම හේතුවෙන් මෙරට තේ වතු නිෂ්පාදකයෝ ගැටලු රැසකට මුහුණපා සිටිති. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම යි. බලංගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ එගොඩ වලේබොඩ සහ වෙළේකුඹුර යන ග්‍රාම නිලධාරී වසම් දෙකට අයත් උඩකන්ද, මනතුංකන්ද සහ සීතගල යන ගම්මාන තුන පදනම් කරගෙන කුඩා තේ වතු හිමියන් 30 ක නියදියක් තෝරාගෙන ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර රැස්කර ගන්නා ලද ප්‍රාථමික දත්ත පදනම් කරගෙන මෙම අධ්‍යනය සිදුකරනු ලදී. අධ්‍යයන නියදියෙන් 90% කට වැඩි ප්‍රමාණයක් තේ වගාව ජීවනෝපාය කරගත් අය වන අතර ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ තේ සඳහා නියමිත මිලක් නොලැබීමයි. අවම වශයෙන් දළු කිලෝවකට ලබාදුන් රු. 80 ක මිල නියදියේ කිසිවෙකුටත් ලැබී නොමැති බව අධ්‍යයනයෙන් හෙලි විය. තේවලට නිසි මිලක් නොලැබීම වගාකරුවන්ගේ ආදායම් අඩුවීම හා ජීවන තත්ත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකර තිබේ. මෙම ගැටලුකාරී තත්ත්වයෙන් කුඩා තේ වතු හිමියන් සහ තේ වගාවන් ආරක්ෂාකර ගැනීමට නම් රජය විසින් නිශ්චිත ක්‍රමවේදයකට අනුව අවශ්‍ය උපදේශන හා ප්‍රතිපාදන ලබාදීම, වගා රක්ෂන ක්‍රමවේදයක් හඳුන්වා දීම, ප්‍රමිතියෙන් යුතු තේ පොහොර ලබාදීම, අමු තේ දළු මිල දී ගැනීමේ තරගකාරී ක්‍රමවේදයක් ඇති කිරීම, නව තේ ප්‍රභේද වගාවන්ට හඳුන්වා දීම, අමු තේ දළු සඳහා ඉහල මිලක් ලබාදීම වැනි කරුණු ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය තුළින් අවබෝධ කර ගත හැකි විය.

ප්‍රමුඛ පදඃ- කුඩා තේ වතු හිමියන්, ප්‍රතිපත්ති, ගැටලු සහ විසඳුම්

*1. ආර්ථික විද්‍යාව, ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ආචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*